# 2023 මාර්තු මාසයට අදාලව 2023.03.07 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2023.03.07
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | |
|---|---|
| 01.එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 02. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 03. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 07. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 08. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 10. ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 11. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 12.ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා අසනීප තත්වය හේතුවෙන් රෝහල්ගත වී ඇති බැවින් උප සභාපතිතුමාට මූලාසනය හොබවන ලෙස දන්වන ලදී.
2023.02.07 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2023.02.28 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු උප සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් 2023.02.07 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

## 02.01.අඛණ්ඩ විදුලි සැපයුමක් තහවුරු කිරීම සඳහා වන කඩිනම් විදුලි සංරක්ෂණ වැඩසටහන

මේ වන විට රටේ පවතින බලශක්ති අර්බුදයට කඩිනම් විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පියවර ගනිමින් සිටින බැවින් විදුලි ආලෝකය අවශ්‍යම කාල සීමා වලදී හැර අනෙකුත් වේලාවන් වලදී වීදි ආලෝකය නිවා දැමීමටත් රාත්‍රී කාලයේ දි උද්‍යාන අලංකරණ සඳහා විදුලි පහන් දැල්වීම සීමා කිරිමත් නාම පුවරු ආයතන විවෘතව ඇති වේලාවන්හිදී පමණක් සිදුකොට නිවා දැමීම සුදුසු බවත් ගම්වාසින් දැනවත් කරන ලෙසත් දැන්විය.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

**ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා**

බිබිල,වැගම,ශ්‍රී ධම්මපාල මාවත ලිපිනයේ පදිංචි ඒ.එච්.බංදුල සුරියආරච්චි මයා විසින් 2022.07.25 දින කඩ කාමරයක් ගැනීම වෙනුවෙන් ආරක්ෂිත තැන්පත් මුදලක් ලෙස රු.9000.00ක් තැන්පත් කර ඇති බැවින් එම මුදලින් මාසික කඩ කාමර කුලිය ලෙස කපා ගන්නා ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය හා තමා විසින් බදු ගෙන ඇති වැසිකිලිය අසල කඩ කාමරය ඉදිරිපිට ජල කාන්දුවක් සිදු වන අතර එම ජලය සමඟ අධික ලෙස දුර්ගන්ධයක් පවතින බවත් ඉන් වෙළඳසැලේ කටයුතු කරගෙන යාමට අපහසු බවත් මෙය සකස් කර දෙන ලෙසත් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ද ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

**ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා**

බිබිල,අඹේලන්ද ,පල්ලේ අරාව ලිපිනයේ පදිංචි ඩී.එම්.ප්‍රභාත් මහතා විසින් ප්‍රාදේශීය සභාවෙන් ලබා දුන් ජංගම වෙළඳකුටියක් මොණරාගල පාර දොඩම්ගොල්ල ස්ථානයේ පවත්වාගෙන යන බවත් එයින් සැලකිය යුතු ආදායමක් නොලැබෙන බැවින් මාසික ගාස්තු රු.500කට අඩු කර දෙන ලෙසත් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපි ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

ප්‍රශ්නය යොමුකල අය :- ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා

යොමුකල ප්‍රශ්න :-

01.මීට පෙර වීථි ලාම්පු අළුත්වැඩියාව සඳහා මන්ත්‍රී කොට්ඨාශයකට ලබා දී තිබූ දින දෙක අවලංගු කර තිබේද?

02. දැනට මාස 02ක පමණ කාලයක සිට මා නියෝජනය කරන කොට්ඨාශය තුල බොහෝ වීථි ලාම්පු අක්‍රීයව තිබේ.ඒවා අළුත්වැඩියා නොකරන්නේ කුමන හේතුවක් නිසාද?

03. ඒ සඳහා උපකරණ හිගයක් පවතින්නේ නම් ඒවා මිලදී ගැනිමට කටයුතු නොකරන්නේ කුමන හේතුවක් නිසාද?

04. කඩිනමින් වීථි ලාම්පු අළුත්වැඩියා කර මහජනයාගේ අපේක්ෂාවන් ඉටු කිරිමට කටයුතු කරන්නේද?

**පිලිතුර :-**

01. නැත
02. වැසි දිනයන් වලදී අළුත්වැඩියා කටයුතු නොකෙරූ බවත්
03. මිල ගණන් ජනවාරි සිට නැවත් කැදවීමට සිදු වී නිසා කෙටි කාලයක් ගත වූ බවත්
04. ඔව් යන්නත් දන්වා සිටින ලදි.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

### 05.01.<u>ගරු මූලාසනයේ යෝජනා.</u>

#### <u>05.01.01. බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත ඇති වෙළඳකුටි වලින් අය කර ගනු ලබන මුදල සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නගරයෙන් පිටත වෙළඳාම් කටයුතු සඳහා ලබාදුන් වෙළඳකුටි පරීක්ෂණ මට්ටමෙන් ලබා දුන් අතර එම වෙළඳකුටි ලබා ගත් පුද්ගලයන් විසින් එහි වෙළදාම අඩු බව දන්වා ඇත.එ බැවින් එම වෙළඳකුටි වලින් කාර්තුවකට රු.1000.00 බැගින් ගාස්තුවක් අය කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

#### <u>05.01.02. බහු කාර්ය ගොඩනැගිල්ලේ (රදලියද්ද මාතෘ සායනයේ) වැසිකිලි පද්ධතියක් හා ලීටර් 5000 වතුර ටැංකිය රදවා ගැනීමට කොන්ක්‍රීට් අට්ටාලයක් සකස් කිරිම සම්බන්ධවයි.</u>

බහු කාර්ය ගොඩනැගිල්ලේ (රදලියද්ද මාතෘ සායනයට) වැසිකිලි දෙකක් හා නාන ස්ථානයක් සකස් කිරිමට හා ලීටර් 5000 වතුර ටැංකිය රඳවා තබා ගැනීමට අට්ටාලයක් සකස් කර ගැනිමත් රුපියල් ලක්ෂ 30ක් පමණ මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරන බැවින් එම මුදල සභා අරමුදලින් දැරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී බහු කාර්ය ගොඩනැගිල්ලේ (රදලියද්ද මාතෘ සායනයට) වැසිකිලි දෙකක් හා නාන ස්ථානයක් සකස් කිරිම හා ලීටර් 5000 වතුර ටැංකිය රඳවා තබා ගැනීමට අට්ටාලයක් සකස් කිරිම සුදුසු බවත් **ඒ සඳහා වැය වන මුදල නිවැරදිව ඇස්තමේන්තු කර එය අනුමත කර ගෙන** සිදු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බහු කාර්ය ගොඩනැගිල්ලේ (රදලියද්ද මාතෘ සායනයට) වැසිකිලි දෙකක් හා නාන ස්ථානයක් සකස් කිරිම හා ලීටර් 5000 වතුර ටැංකිය රඳවා තබා ගැනීමට අට්ටාලයක් සකස් කිරිම සුදුසු බවත් **ඒ සඳහා වැය වන මුදල නිවැරදිව ඇස්තමේන්තු කර එය අනුමත කර ගෙන** සිදු කිරිම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.03. මාස 03කට වඩා හිඟ ජල ගාස්තු නොගෙවූ ජල පාරිභෝකයින්ගෙන් දඩ මුදලක් අය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රම වල මාස 03කට වඩා හිඟ ජල ගාස්තු නොගෙවන ලද ජල පාරිභෝගිකයින්ගෙන් දඩ මුදලක් අය කිරීම සුදුසු බවත් මේ පිළිබඳ සාකච්ඡා කර දඩ මුදලක් තීරණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී හිඟ ජල ගාස්තු නොගෙවන ලද ජල පාරිභෝගිකයින්ගෙන් මෙවන් කාල වකවානුවක් තුල දඩ මුදලක් අය කිරීම **නුසුදුසු** බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

හිඟ ජල ගාස්තු නොගෙවන ලද ජල පාරිභෝගිකයින්ගෙන් මෙවන් කාල වකවානුවක් තුල දඩ මුදලක් අය කිරීම **නුසුදුසු** බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. සිරිසඟබෝ මාවත 1 පටුමග යාර 400 ට වැඩි වරිපනම් ඒකක 2023 සිට බිල් කිරීම් නැවැත්වීමේ සභා යෝජනාව

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරනු ලබන්නේ දියුනු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බිබිල මඩකලපුව පාරේ අඹගොල්ල හංදිය දක්වා ද, බිබිල මහියංගන පාරේ 3 කණුව දක්වා ද, බිබිල ගල්ගේලන්ද පාරේ ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා ද, බිබිල බදුල්ල පාරේ යල්කුඹුර ජල ගබඩා ටැංකිය දක්වා ද, බිබිල මොනරාගල පාරේ ගල්ඔය දක්වා ද, බිබිල පිටකුඹුර පාරේ 1 කණුව දක්වා ද, බිබිල දම්පතිගම පාරේ ප්‍රජා ශාලාව දක්වා ද ප්‍රධාන පාරේ සිට දෙපසට යාර 400 වූ සීමාව තුළය.

එහෙත් මෙම සීමාවන්ට පිටතින් වරිපනම් බදු අය කරන බවට බදු කරුවන් විසින් විරෝධතා ඉදිරි පත් කර ඇත.ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාවේ නිළධාරීන්ගේ කමිටුවක් පත් කර ඒ පිළිබඳ විමර්ශනය කිරීමට කටයුතු කරන ලදී.එම කමිටු නිළධාරීන් පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ගරු මන්ත්‍රී බී.විල්මට් සිල්වා මැතිතුමා | -. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| ඒ.එම් නලින්ද සිරි බණ්ඩාර මයා | - | තාක්ෂණ නිලධාරී |
| එච්.එම් ජයරත්න මයා | - | ආදායම් පරීක්ෂක |
| ඩබ්.එම් කරුණාතිලක මයා | - | ක්ෂේත්‍ර කම්කරු |
| රුවන් මිහිරංග මයා | - | ක්ෂේත්‍ර කම්කරු |
| ඩී.එම් ගයානි නදීෂා | - | විෂය භාර නිලධාරී. |

ඒ අනුව 2022.05.30 වන දින කමිටුව රැස් වී මේ පිළිබඳ සාකච්ඡා කර 2022.06.06 දින සිරිසඟබෝ මාවතේ අදාළ ස්ථානය මිණුම් කටයුතු කරන ලදී.ඒ අනුව මෙම බදු අංක වරිපනම් සීමාවෙන් පිටත පිහිටා ඇති බවත් එම බදු ඒකක ඉවත් කිරීමට සුදුසු බවත් ඉදිරිපත් කරන ලදී.

2023 ජනවාරි 01 දින සිට පහත සඳහන් සමීක්ෂණය කරන ලද බදු ඒකකවල රු3731.15 ක වාර්ෂික වරිපනම් බදු මුදල ඉවත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ | බදු අංකය | පාර | බදුකරුගේ නම | වාර්ෂික වටිනාකම | වාර්ෂික වරිපනම් බදු කුලිය |
|---|---|---|---|---|---|
| 01 | 05 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | එච්.එන්.ආර් නිමල්සිරි මයා | 12531.00 | 626.55 |
| 02 | 5/4 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | එම්.කේ සුනිල් අභය වික්‍රම මයා | 14571.00 | 728.55 |
| 03 | 15 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | එච්.එන්.ආර් ගුණවති මිය | 250.00 | 12.50 |
| 04 | 23 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | යූ.එච් ගාමිණී මයා | 7286.00 | 364.30 |
| 05 | 29 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | තුෂාර මයා(කේ.එම් නිලන්ත හේමසිරි මයා) | 250.00 | 12.50 |
| 06 | 31 | සිරිසගබෝ මාවත-1 පටුමග(වම) | අයිතිකරු(කේ.එම් තිලකරත්න ප්‍රේමසිරි මයා) | 9229.00 | 461.45 |
| 07 | 06 | සිරිසගබෝ මාවත-1 පටුමග(දකුණ) | ඩී.ජී විල්බට් මයා | 3778.00 | 188.90 |
| 08 | 12 | සිරිසගබෝ මාවත-1 පටුමග(දකුණ) | ඩී.ජී විල්බට් මයා | 250.00 | 12.50 |
| 09 | 20 | සිරිසගබෝ මාවත-1 පටුමග(දකුණ) | ඒ.එන්.ඒ ප්‍රෙමදාස මයා | 2914.00 | 145.70 |
| 10 | 24 | සිරිසගබෝ මාවත-1 පටුමග(දකුණ) | අයිතිකරු | 23314.00 | 1165.70 |
| 11 | 28 | සිරිසගබෝ මාවත-1 පටුමග(දකුණ) | ආර්.එම් විමලසේන මයා | 250.00 | 12.50 |
| | | **එකතුව** | | | **3731.15** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**මාසික සභා රැස්වීම තේ පැන් සංග්‍රහය සඳහා පෙ.ව 11.30ට අවසන් කර අතර නැවත පෙ.ව.11.45ට ආරම්භ කරන ලදී.**

## <u>05.01.05.කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැලක් ආරම්භ කිරීම සම්බන්ධවයි.</u>

බිබිල ,කිවුලපිටලන්ද, "සිසිල සෙවන" ලිපිනයේ පදිංචි ආර්.වී.ජේ.ආර්.ජයසිංහ මයා විසින් බිබිල සති පොල අසල කිරි අලෙවිසැලක් ඉල්ලා ඇති අතර ඊට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ,

අලෙවි කුටිය හා එයට අවශ්‍ය දැනුම තමා සතුව ඇති බව දන්වා ඇති අතර එම ස්ථානය පරීක්ෂා කර ආදායම් පරීක්ෂකගේ වාර්තාවක් ලබා ගෙන ඇති අතර එම වාර්තාවෙන් අඩි 8*7 ප්‍රමාණයේ කුටියක් බිබිල සතිපොලට පිවිසෙන මාර්ගයේ වම් පස හෝ දකුණු පස ස්ථාපනය කිරීමට කළ හැකි බව දන්වා ඇත.එම ස්ථානය සඳහා ගාස්තුවක් තීරණය කිරීමත් එම ස්ථානය කිරි ආශ්‍රිත වෙළදසැලක් ස්ථාපනය කිරීමත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කුටියක් බිබිල සතිපොලට පිවිසෙන මාර්ගය අවහිර වීම නිසා එම ස්ථානයේ සකස් කිරීම **නුසුදුසු** බවත් එම කිරි අලෙවිසැල ආදායම් **පරීක්ෂකගේ වාර්තාවක් ගෙන වෙනත් සුදුසු ස්ථානයක ස්ථානගත කර ආරම්භ කිරීම** සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කුටියක් බිබිල සතිපොලට පිවිසෙන මාර්ගය අවහිර වීම නිසා එම ස්ථානයේ සකස් කිරීම **නුසුදුසු** බවත් එම කිරි අලෙවිසැල **පරීක්ෂකගේ වාර්තාවක් ගෙන වෙනත් සුදුසු ස්ථානයක ස්ථානගත කර ආරම්භ කිරීම** සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06. පරිගණක යන්ත්‍ර හතරක් මිලදී ගැනීම සම්බන්ධවයි.

පාර්ලිමේන්තුවේ ගිනුම් කාරක සභාවේ නිර්දේශය අනුව ඉදිරියේදී අප ආයතනයේ සියළුම සේවාවන් අන්තර්ජාලය හරහා සිදු කිරීමට අපේක්ෂා කරන බැවින් ආයතනයේ සේවයකරන සියළුම නිලධාරින්ට ඒ සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලසිය යුතුව ඇත.දැනට අප ආයතනයේ පෙරටු කාර්යාලයේ වෙනම නිලධාරියකු යොදවා ඔහුගේ සම්බන්ධීකරනය මත සෙසු අංශ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.ඒ අනුව පෙරටු කාර්යාල නිලධාරියාට එක් පරිගණක යන්ත්‍රයකුත් ගිනුම් අංශයේ වැය විෂය සඳහා එක් පරිගණක යන්ත්‍රයකුත් ආයතන අංශයේ තැපැල විෂය හා ගබඩා විෂය සඳහා එක් පරිගණකය බැගින් පරිගණක දෙකකුත් සමඟ පරිගණක යන්ත්‍ර 04 ක් ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07. පොදු වෙළඳපොල A-16 කඩ කාමරය සම්බන්ධවයි.

බිබිල පොදු වෙළඳපොල A -16 කඩ කාමරය සුන්දර බේක්හවුස්,පොදුවෙළඳපොල,බිබිල ලිපිනයේ එච්.එම්.කරුණාසුන්දර යන අය විසින් බදු ගෙන ඇත. මෙම කඩ කාමරයේ බිත්ති පුපුරා ගොස් ගිලා බැස ඇති අතර මෙහි වෙළදාම් කටයුතු සිදුකිරීම අවදානම් තත්වයක පවතින බැවින් එම කඩ කාමරය වසා ඇති බවත් එම වසා තිබූ කාල සීමාවට කඩ කාමර කුලී ගෙවීම

සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන ලෙසත් 2022.12 වන මස ඒ මහතා විසින් ලිඛිතව දන්වා තිබුණි. මෙම කඩ කාමරය සඳහා 2022.12.31 දින වන විට හිඟ මුදල වශයෙන් රු.5000.00 ක මුදලක් පැවතුණි. ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාවේ 2023.01.05 දින 05.01.09 සභා තීරණය අනුව හිඟ කුලී මුදල වන 5000.00 ක මුදල කපා හැරීම් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමටත් කඩ කාමරය අළුත් වැඩියා කටයුතු සිදුකිරීමටත් තීරණය කර ඇත. ඒ අනුව මෙම කඩ කාමරය අළුත් වැඩියා කටයුතු සිදුකල යුතුව පවති.එබැවින් 2023 පෙබරවාරි මස සිට මෙම කඩ කාමරය සඳහා කුලී මුදල් අය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් සිදුකල අතර මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අළුත්වැඩියා කටයුතු කර අවසන් වන තෙක් වසා තබනු ලබන කාලය සඳහා (2023 පෙබරවාරි මස සිට) මාසික කුලිය ගණනය කිරීම අත්හිටුවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී අළුත්වැඩියා කටයුතු කර අවසන් වන තෙක් වසා තබනු ලබන කාලය සඳහා (2023 පෙබරවාරි මස සිට) මාසික කුලිය ගණනය කිරීම අත්හිටුවීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08. පොදු වෙළඳපොල A-16 කඩ කාමරය අළුත්වැඩියා කිරිම සම්බන්ධවයි.</u>

බිබිල පොදු වෙළඳපොල A -16 කඩ කාමරය සුන්දර බේක්හවුස්,පොදුවෙළඳපොල,බිබිල ලිපිනයේ එච්.එම්.කරුණාසුන්දර යන අය විසින් බදු ගෙන ඇත. මෙම කඩ කාමරයේ බිත්ති පුපුරා ගොස් ගිලා බැස ඇති අතර මෙහි වෙළදාම් කටයුතු සිදුකිරීම අවදානම් තත්වයක පවතින බැවින් එම කඩ කාමරය වසා ඇති බැවින් එම කඩ කාමරය සකස් කිරීමට රු.2,630,884.44ක ඇස්තමේන්තු මුදලක් ඉදිරිපත් කර ඇති අතර එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී රු. 2,630,884.44ක මුදලක් මෙම අවස්ථාවේ එක් කඩකාමරයක් වෙනුවෙන් වැය කර සකස් කිරිම ඵල රහිත ක්‍රියාවක් වේ.ඊට හේතුව ලෙස මෙම කඩකාමරය සහිත ගොඩනැගිල්ල ඉදිකර දැනට වසර 40ක් ද ඉක්මවා ඇති බැවින් නොබෝ කාලයකින් කඩා ඉවත් කිරිමට සැලසුම් කර ඇත. එබැවින් රු. 2,630,884.44ක මුදලක් වැය කර එක් කඩකාමරයක් පමණක්

සහා අරමුදලින් අළුත්වැඩියා කර එම මුදල උපයා ගැනීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් මෙය ඵල රහිත ක්‍රියාවක් වන බවත් මේ සඳහා කොමසාරිස්තුමාගේ උපදෙස් පැතිම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

රු. 2,630,884.44ක මුදලක් මෙම අවස්ථාවේ එක් කඩකාමරයක් වෙනුවෙන් වැය කර සකස් කිරිම ඵල රහිත ක්‍රියාවක් වේ.ඊට හේතුව ලෙස මෙම කඩකාමරය සහිත ගොඩනැගිල්ල ඉදිකර දැනට වසර 40ක් ද ඉක්මවා ඇති බැවින් නොබෝ කාලයකින් කඩා ඉවත් කිරිමට සැලසුම් කර ඇත. එබැවින් රු. 2,630,884.44ක මුදලක් වැය කර එක් කඩකාමරයක් පමණක් සහා අරමුදලින් අළුත්වැඩියා කර එම මුදල උපයා ගැනීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් මෙය ඵල රහිත ක්‍රියාවක් වන බවත් මේ සඳහා කොමසාරිස්තුමාගේ උපදෙස් පැතිම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.09. J.C.B. යන්ත්‍රය සඳහා අඩි 01 බකට් එකක් මිලදී ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශිය සභාවේ JCB යන්ත්‍රයේ දැනට අඩි 02 බකට් එකක් පවතින අතර එය ජල නල එලීම වැනි කාණු පද්ධතියන් සකස් කිරීමේ දී මෙන්ම අනෙකුත් කර්මාන්ත වලදී ද ගැටළුවලට මුහුණ දී ඇති බැවින් අඩි 01ක ප්‍රමානයේ බකට් එකක් ලබා ගැනිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.10. බිබිල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ මිලදී ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි සේවය කරන ආයුර්වේද භෛසජ්ජක ඒ.එම් කමලාවතී මහත්මිය විසින් ආයුර්වේද මධ්‍යස්ථානය තුල ප්‍රතිකාර කටයුතු සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හිඟ වී ඇති බවත් රෝගීන් හට ප්‍රතිකාර කටයුතු කිරීමට එය බලපා ඇති බවත් එම හිඟ ඖෂධ ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම සාධාරණ බැවින් අවශ්‍ය කටයුතු සපුරා දීම සුදුසු බවත් ඒ සඳහා වැය වන රු. 503840.00 ක මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි. එම හිඟ ඖෂධ ලැයිස්තුව පහත සඳහන් කරමි.

| ඖෂධ වර්ග | ප්‍රමාණය | ඒකක මිල | ගණන | මුළු මුදල |
|---|---|---|---|---|
| <u>තෛල</u><br>ගුලහර | මි. ලී.750 | 1440.00 | 05 | 7200.00 |
| පිණ්ඩ | මි. ලී.750 | 2400.00 | 20 | 48000.00 |
| සර්ශප | මි. ලී.750 | 2650.00 | 20 | 53000.00 |

| | | | | |
|---|---|---|---|---|
| නිර්ගුණ්ඩි | මි. ලී.750 | 1680.00 | 15 | 25200.00 |
| නිලාාදි | මි. ලී.750 | 1940.00 | 05 | 9700.00 |
| කැඩුම් බිඳුම් | මි. ලී.750 | 1950.00 | 05 | 9750.00 |
| නාරයන | මි. ලී.750 | 2850.00 | 03 | 8550.00 |
| ත්‍රිපලා | මි. ලී.750 | 1620.00 | 05 | 8100.00 |
| දිව්‍යංනාදි | මි. ලී.750 | 1570.00 | 03 | 4710.00 |
| කෝලලේස්මා | මි. ලී.750 | 2880.00 | 02 | 5760.00 |
| සර්වවිෂදි | මි. ලී.750 | 2500.00 | 02 | 5000.00 |
| විසර්පහර | මි. ලී.750 | 2220.00 | 02 | 4440.00 |
| පාඨා | මි. ලී.750 | 2670.00 | 02 | 5340.00 |
| භෘංගමාලක | මි. ලී.750 | 2300.00 | 02 | 4600.00 |
| බාකුචි | මි. ලී.750 | 1550.00 | 01 | 1550.00 |
| ඉරිමේදාදි | මි. ලී.750 | 1750.00 | 01 | 1750.00 |
| **එකතුව** | | | | **202650.00** |
| රිස්නා 07 | මි. ලී.750 | 490.00 | 10 | 4900.00 |
| දශමූලක්නත | මි. ලී.750 | 530.00 | 15 | 7950.00 |
| ඒරණ්ඩ | මි. ලී.750 | 400.00 | 10 | 4000.00 |
| දෙනිඩ | මි. ලී.750 | 680.00 | 10 | 6800.00 |
| මධූකා | මි. ලී.750 | 900.00 | 03 | 2700.00 |
| කතකාසවය | මි. ලී.750 | 320.00 | 05 | 1600.00 |
| නිම්බ | මි. ලී.750 | 350.00 | 05 | 1750.00 |
| ශ්‍රේෂත්‍ර නිම්බ | මි. ලී.750 | 410.00 | 05 | 2050.00 |
| දාරුපාරපට | මි. ලී.750 | 650.00 | 10 | 6500.00 |
| අශෝක | මි. ලී.750 | 380.00 | 05 | 1900.00 |
| චන්දන | මි. ලී.750 | 300.00 | 03 | 900.00 |
| පිපිපලාාදාාසවය | මි. ලී.750 | 350.00 | 07 | 2450.00 |
| දූසෂාරිෂ්ඨය | මි. ලී.750 | 650.00 | 05 | 3250.00 |
| පුනර්නවාසවය | මි. ලී.750 | 1020.00 | 10 | 10200.00 |
| චිරබිල්ව | මි. ලී.750 | 720.00 | 03 | 2160.00 |
| පංචමුල | මි. ලී.750 | 790.00 | 05 | 3950.00 |
| යසෂාෂි | මි. ලී.750 | 600.00 | 03 | 1800.00 |
| මේදහරණී | මි. ලී.750 | 680.00 | 05 | 3400.00 |
| ධාන්‍යාදි පංචක | මි. ලී.750 | 340.00 | 05 | 1700.00 |
| දන්තමූලබලා | මි. ලී.750 | 560.00 | 15 | 8400.00 |
| මුස්තක | මි. ලී.750 | 380.00 | 03 | 1140.00 |
| අමෘතා | මි. ලී.750 | 495.00 | 03 | 1485.00 |
| අභයා | මි. ලී.750 | 630.00 | 03 | 1890.00 |
| පටෝල | මි. ලී.750 | 725.00 | 05 | 3625.00 |
| තිකටු කාදි | මි. ලී.750 | 680.00 | 05 | 3400.00 |
| අරවින්දාසවය | මි. ලී.750 | 300.00 | 02 | 600.00 |
| ලෞහාසවය | මි. ලී.750 | 360.00 | 05 | 1800.00 |
| බලා | මි. ලී.750 | 730.00 | 05 | 3650.00 |

| | | | | |
|---|---|---|---|---|
| අශ්වගන්ධ | මි. ලී.750 | 700.00 | 05 | 3500.00 |
| උෂීර | මි. ලී.750 | 320.00 | 02 | 640.00 |
| **එකතුව** | | | | **100090.00** |
| කල්ක<br>නවරත්න | ග්‍රෑ.250 | 580.00 | 10 | 5800.00 |
| චන්ද්‍ර කල්ක | ග්‍රෑ.250 | 850.00 | 02 | 1700.00 |
| ශර්කරාදි | ග්‍රෑ.250 | 1000.00 | 03 | 3000.00 |
| කූෂ්මාණ්ඩ | ග්‍රෑ.400 | 1300.00 | 01 | 1300.00 |
| වචන | ග්‍රෑ.400 | 1000.00 | 01 | 1000.00 |
| බුද්ධරාජ | ග්‍රෑ.250 | 4550.00 | 02 | 9100.00 |
| දෙසදුන් | ග්‍රෑ.400 | 1050.00 | 01 | 1050.00 |
| **එකතුව** | | | | **22950.00** |
| කැප්සුල්<br>සුදර්ශන කැප්සුල් | ග්‍රෑ.500 | 4250.00 | 01 | 4250.00 |
| **එකතුව** | | | | **4250.00** |
| ගුලි<br>සංඛවටී | ග්‍රෑ.250 | 4000.00 | 01 | 4000.00 |
| සිතාරාම | ග්‍රෑ.250 | 2630.00 | 04 | 10520.00 |
| ගෝසෂර | ග්‍රෑ.250 | 2400.00 | 05 | 12000.00 |
| චන්ද්‍ර ප්‍රභා | ග්‍රෑ.250 | 1750.00 | 05 | 8750.00 |
| යෝගරාජා | ග්‍රෑ.250 | 1500.00 | 10 | 15000.00 |
| වාතගජේන්ද්‍ර | ග්‍රෑ.250 | 7800.00 | 01 | 7800.00 |
| රාමබාන | ග්‍රෑ.250 | 5085.00 | 02 | 10170.00 |
| පුනර්නවා මණ්ඩුර | ග්‍රෑ.250 | 3000.00 | 01 | 3000.00 |
| ත්‍රිපලා | ග්‍රෑ.250 | 800.00 | 03 | 2400.00 |
| මේදහරණී | ග්‍රෑ.250 | 950.00 | 03 | 2850.00 |
| කෛශෝර | ග්‍රෑ.250 | 2000.00 | 05 | 10000.00 |
| ක්‍රිමිගාතනි | ග්‍රෑ.250 | 2200.00 | 01 | 2200.00 |
| ජීවාන්ද | ග්‍රෑ.250 | 3800.00 | 01 | 3800.00 |
| ශ්වසකුෂාර | ග්‍රෑ.250 | 8200.00 | 01 | 8200.00 |
| **එකතුව** | | | | **100640.00** |
| චූර්ණ වර්ග<br>ධාණී | ග්‍රෑ.500 | 390.00 | 05 | 1950.00 |
| සුකුමාර | ග්‍රෑ.500 | 390.00 | 05 | 1950.00 |
| මාණිභද්‍ර | ග්‍රෑ.500 | 450.00 | 05 | 2250.00 |
| හාෂ්කර ලවණ | ග්‍රෑ.500 | 840.00 | 05 | 4200.00 |
| ත්‍රිපලා | ග්‍රෑ.500 | 590.00 | 05 | 2950.00 |
| මංජනේ | ග්‍රෑ.500 | 1000.00 | 02 | 2000.00 |
| නාලිසාදි | ග්‍රෑ.500 | 660.00 | 02 | 1320.00 |
| සුදර්ශන | ග්‍රෑ.500 | 1350.00 | 10 | 13500.00 |
| අශවගන්ධ | ග්‍රෑ.500 | 1100.00 | 02 | 2200.00 |
| අවිපත්තිකර | ග්‍රෑ.500 | 700.00 | 05 | 3500.00 |

| | | | | |
|---|---|---|---|---|
| සුවධරණී | ග්‍රෑ.500 | 860.00 | 10 | 8600.00 |
| **එකතුව** | | | | **44420.00** |
| <u>ලේප</u><br>දශාංග | ග්‍රෑ.500 | 1300.00 | 03 | 3900.00 |
| ලාක්ෂදි | ග්‍රෑ.250 | 590.00 | 10 | 5900.00 |
| කාග් | ග්‍රෑ.250 | 660.00 | 10 | 6600.00 |
| ජීවාලේප බාම් | ග්‍රෑ.10 | 110.00 | 20 | 2200.00 |
| තැම්බුම් හොදි | ග්‍රෑ.5 | 25.00 | 50 | 1250.00 |
| පේයාව | ග්‍රෑ.5 | 25.00 | 50 | 1250.00 |
| **එකතුව** | | | | **21100.00** |
| කෝමාරිකා ෂැම්පු | | 230.00 | 10 | 2300.00 |
| කපුකම්හ ෆේෂ්වොෂ් | | 280.00 | 07 | 1960.00 |
| පංචවල්කල බොඩි වොෂ් | | 210.00 | 07 | 1470.00 |
| සුදුහඳුන් ෆේෂ්වොෂ් | | 280.00 | 07 | 1960.00 |
| **එකතුව** | | | | **7690.00** |
| **මුළු එකතුව** | | | | **503840.00** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.11. රතුපස්කැටිය පොම්පිය ජල යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය පී.වී.සී. නල හා උපාංග මිලදී ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරිනි සුලෝචනා සෙනෙවිරත්න මිය විසින් රතුපස්කැටිය පොම්පිය ජල යෝජනා ක්‍රමයේ ප්‍රධාන නල මාර්ග (නල ළිඳේ සිට ගබඩා ටැංකිය) සහ බෙදාහැරීමේ නල මාර්ගය (ගබඩා ටැංකියේ සිට ඉසුරු උයන හා මහියංගන මාර්ගය) දක්වා පී.වී.සී. හා උපාංග එළීම සඳහා ඇස්තමේන්තු ගත මුදල රු.7094877.35 ක් බව දන්වා ඇති බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.12. බිබිල නගරයේ ජංගම වෙළදාමේ යෙදෙන ව්‍යාපාරිකයින් සඳහා නිල ඇඳුමක් සහ හැඳුනුම්පතක් ලබා දීම සම්බන්ධවයි.</u>

බිබිල නගරය තුළ ජංගම වෙළදාමේ යෙදෙන ව්‍යාපාරිකයින් හඳුනා ගැනීම සඳහා එම ව්‍යාපාර සිදුකරන වෙළඳ මහත්ම මහත්මීන්හට නිල ඇඳුමක් සහ ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරන හැඳුනුම්පතක් සකස් කර ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී හැදුනුම්පතක් සකස් කර දීම සුදුසු බවත් නිල ඇඳුමක් සඳහා ව්‍යාපාරිකයින් විසින්ම වියදම් දරා සිදු කිරිමට කැමතිද යන්න ඔවුන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

හැදුනුම්පතක් සකස් කර දීම සුදුසු බවත් නිල ඇඳුමක් සඳහා ව්‍යාපාරිකයින් විසින්ම වියදම් දරා සිදු කිරිමට කැමතිද යන්න ඔවුන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13. ජල සාම්පලයක් පරීක්ෂා කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කවුඩැල්ල ග්‍රාම නිලධාරි වසමේ බදුල්ලගම්මන මාර්ගයේ පිහිටි ''සිටි මෝටර්ස්'' නමින් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යනු ලබයි. මෙම ස්ථානයට යාබද නිවසේ පානීය ජලය ලබා ගන්නා ළිඳෙහි ජලය ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමින් තෙල් තට්ටුවක් සහ යම් ගඳක් වහනය වීමක් සිදුවන බවට ප්‍රාදේශීය සභාව වෙත පැමිණිලි ඉදිරිපත් වී ඇත. තවද මෙම පැමිණිලිකරු මේ සම්බන්ධව ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාට ද ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව ගරු ආණ්ඩුකාර තුමා විසින් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී මහතා යොදවා ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමේදී නියමිත දුර හා නිර්මිත සම්පූර්ණ කර ඇතත්, ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඒකාබද්ධ අධීක්ෂණයක් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, පරිසර අධිකාරිය, පරිසර පොලීසිය) මගින් අදාල ළිඳෙහි ජල සාම්පලයක් ලබා ගෙන පරීක්ෂා කර වාර්තාව ලබා ගත යුතුව ඇත. එහෙත් එම පරීක්ෂණය සඳහා රු.2500.00 ක පමණ මුදලක් වැය වෙතැයි අපේක්ෂා කරන බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14. පොල්ලෙලි කුඩු කිරීමේ (coconut dust) කර්මාන්තය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරිනි සුලෝචනා සෙනෙවිරත්න මිය විසින් පොල්ලෙලි කුඩු කිරීමේ කර්මාන්තය සඳහා ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) මඟින් උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ 35ක් ලබා දෙන අතර අදාල මැෂින් තබා ගැනීමට

ගොඩනැගිල්ලක් ඉදි කිරීම(අඩි 20*12) හා පොල්ලෙලි වියලීම සඳහා විවෘත කොන්ක්‍රීට් බිමක් සැකසීම (අඩි 30*20) ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් ලක්ෂ 28ක් බව දන්වා ඇති බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. ආයුර්වේද ගොඩනැගිල්ල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරිනිය විසින් ආයුර්වේද ගොඩනැගිල්ල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානය ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.21,904,764.50 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. එම මුදල මිල විචලනයන්ට ද යටත්ව සකස් කර ඇත.එබැවින් එම මුදල සභා අරමුදලින් දරා අදාල ගොඩනැගිලි ඉදි කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16. අන්තර්ජාල වෙබ් අඩවිය නිර්මාණය කිරිම හා නඩත්තු කටයුතු සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව පිළිබඳ තොරතුරු ලබා ගැනීම, සියළුම ගෙවීම්,වීපී රේඛා සම්බන්ධ ඉල්ලුම්පත්‍ර, කසල ඉවත් කිරීමේ සේවාවන්,ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සේවාව හා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව ආදි සියළු කටයුතු අන්තර්ජාලය හරහා සිදු කිරිමට කටයුතු යොදා ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය වෙබ් අඩවිය සකස් කිරිමට ServerClub.lk ආයතනය ඉදිරිපත් වී ඇති අතර එම ආයතනය මඟින් අන්තර්ජාල වෙබ් අඩවිය නිර්මාණය, සංවර්ධය හා ආරක්ෂණ පද්ධතිය නිර්මාණය කිරිම,අන්තර්ජාල ගෙවීම් පද්ධතිය නිර්මාණය කිරිම සහ සියළුම ගෙවිම් පද්ධති ඒකාබද්ධ කිරීමේ සේවාවන් ලබා දීම සඳහා රු.345,000.00ක ඇස්තමේන්තු මුදලක් ඉදිරිපත් කර ඇති අතර එම මුදල මිල විචලනයන්ට ද යටත්ව සකස් කර ඇත.එබැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා

## 05.02.01.සංවර්ධන යෝජනා.

බිබිල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන (අමතර පන්ති) අධ්‍යාපන ආයතන නිසි නියාමනයක් කිරීමට අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරිම සුදුසු බවත් මෙන්ම මීට පෙර අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ඇත්නම් එය බලාත්මක කිරීම සුදුසු බවත් එහිදී සියලුම ආයතන

ප්‍රාදේශීය සභාව තුල ලියාපදිංචි කිරීම, සනීපාරක්ෂක පහසුකම් අධීක්ෂණය,පන්ති කාමරවල ගුණාත්මකභාවය ,ප්‍රචාරක කටයුතුවලින් පරිසර හානිය අවම කිරීම හා විනය ගරුක දරු දැරියන් පිරිසක් බිහි කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

2023 පෙබරවාරි මාසයේ මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදි.

එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබූනේ බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රදලියද්ද පොදු සුසාන භූමිය පිහිටි ඉඩමෙහි ඉදි කරන ලද බහු කාර්ය ගොඩනැගිල්ලේ අත්වැට ඉදිකිරීමට අදාල කුළී මුදල් ගෙවීම. රු.105980.00 ක මුදලක් R. P. J. ප්‍රභාත් මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රදලියද්ද පොදු සුසාන භූමිය පිහිටි ඉඩමෙහි ඉදි කරන ලද බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමට ද්‍රව්‍ය ලබා ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.114095.00 ක මුදලක් ඌව රෝයල් ට්‍රේඩින් පුද්ගලික සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලෙස A 4 බන්ඩල් 132 ක් ලබා ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම.රු.345411.00 ක මුදලක් Real Genius.lk ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේදයට අවශ්‍ය ඖෂධ ලබා ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම.රු.120100.00 ක මුදලක් Sri Lanka Ayurvedic Drugs corporation ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම.රු.1133750.00 ක මුදලක් J.S.B.Trading (pvt) Ltd ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම හා බිබිල ප්‍රාදේශීය සභා නායකදූර ජල යෝජනා ක්‍රමයේ නල ළිඳෙහි ජල ධාරිතාව පරීක්ෂා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම.රු.124975.00 ක මුදලක් Geo Water (pvt) Ltd ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි. එහි දී මන්ත්‍රී මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව

සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලිම.

2023 ජනවාරි මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 12,104,774.69** |
| මූලධන ලැබීම් | **- රු. -** |
| **ප්‍රාග්ධන ලැබීම්** | **-** රු. - |
| වෙනත් ලැබීම් | - රු. 41,352,468.03 |
| මුළු ලැබීම් | - රු **53,457,242.72** |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 4,923,541.93 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 10,100.00 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 2,974,176.66 |
| ආයෝජන | _රු. 40,000,000.00 |
| මුළු වියදම් | - රු 47,907,818.59 |

**2023.01.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | මුළු එකතුව | තවදුරටත් පවතිනා හිගය |
|---|---|---|
| වරිපනම් බදු | රු. 259,112.50 | - රු. 5,776,549.73 |
| අක්කර බදු | - | - රු. 198.40 |
| ජල ගාස්තු | රු.237,144.00 | - රු. 617,107.78 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | රු. 95,217.00 | - රු. 226,597.00 |
| කුලී මුදල් | රු.463,783.34 | - රු. 1,848,164.01 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - | - රු. - |
| 5.23 මාලු කඩ/මස් කඩ | - | - රු. 3,489,899.49 |
| 5.23 සති පොළ | - | - රු. 647,893.71 |
| එකතුව | - රු 1,055,256.84 | - රු 12,633,410.12 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

ගරු සභාපති ජී.ජී.ආර්.සිල්වා මැතිතුමා හා ගරු මන්ත්‍රී ඒ.එම්.සුදුනිලමේ මැතිතුමා වෛද්‍ය හේතුන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රි එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.

ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් බිබිල බස්නැවතුම්පලේ ඉහළ මහලයේ පරවියන් ජරා කිරිම හා අනාචාර ක්‍රියාවන් සිදු වන බව තමා මෙම සභාවේදී පැවසූ බවත් මෙම ගැටළුව පිලිබඳ එහි කඩ කාමර හිමියන් එක්ව ලේකම්තුමිය සමග සාකච්ඡා කල බවත් ඒ අනුව විදුලි ආලෝකය ලබා දීමට කටයුතු කර ඇති බැවින් එය සියළුදෙනාගේ පැසසුමට ලක් වන බවත් මේ නිසා අනාචාර ක්‍රියාවන් සිදු වීම හා පරවියන් ජරා කිරීම අවමවී ඇති බවත් සභාපතිතුමා රෝගාතුර සිටියාවුවද මෙයට සහයෝගය දැක්වූ බැවින් එයට ස්තුතියි වන්ත වන බවත් නිවාඩු දවසක් වුවත් ලේකම්තුමිය සහභාගිවීම නිසා එතුමියටත් ස්තුති වන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම බස්නැවතුම්පලේ ඉහළ මාලයේ ජල ටැංකිය ගැසීම නිසා එම කඩ හිමියන්ට යම් අසාධාරණයක් සිදුව ඇති බව ඔවුන් පවසන බවත් ඒ පිළිබඳ කනගාටු වන බවත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් බිබිල මහජන ක්‍රීඩාංගනය වැඩ නිම කිරීමට ප්‍රථම කානිවල් එකක් සඳහා ලබා දීමට අවසර දී ඇති බවත් එහි දී සිදු වන හානිය සඳහා ලොකු මුදලක් තැන්පතු ලෙස ලබා ගන්නවාද යන්න දැන ගැනිමට තමා කැමති බවත් මේ පිළිබඳව ලේකම්තුමිය අධීක්ෂණය කරන ලෙසත් පැවසීය. තවද මෙවර මැතිවරණයක් නොමැති බවත් ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් රට යම් තත්වයකට ගැනීමට උත්සහ කරන බවත් රටට IMF එක හරහා මුදල් ලබා දීමට සූදානම් බවත් එම මුදල් ලැබුනු පසු රටේ ජනතාවට පෙර පරිදි ජීවත් වීමට හැකි බවත් ගරු සභාපතිතුමා හා ගරු ඒ.එම්.සුදුනිලමේ මන්ත්‍රීතුමා අසනීප තත්වයෙන් පෙළෙන බැවින් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් තමා මෙම සභාවට පැමිණ අවුරුදු එකහමාරක් පමණ වන බවත් ඒ කාලයේදී තමාගේ දේශපාලන ගමනට අත්දැකීම් රාශියක් ලබා ගත් බවත් තමාගේ දේශපාලන දැනුම අනුව 80% ක් පමණ විශ්වාසයක් තියෙනවා තවත් අවුරුද්දක් පමණ මෙය දීර්ඝ කරන බව යන්න ප්‍රකාශ කල අතර අපි සියළුදෙනා සහයෝගයෙන් සභාව තුල කටයුතු කළ බවත් ඒ සඳහා සියළු දෙනාට ස්තුති පලකරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්වීම.

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් වැඩ පුළුවන් කාලයේ දී වැඩ කිරීමට නොදී අතපයබැඳ ඇති බවත් වැඩ කර සභාවට ආදායම වැඩි කරනවා නම් සුදුසු බවත් සභාපතිතුමා අසනීප වී රෝහල්ගත වී ඇති බැවින් එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් එතුමා සමඟ එක් වී මුල් අවදියේ සිට මෙතෙක් කටයුතු කළ බවත් සියළුදෙනා සහයෝගය ලබා දුන් බවත් පොලේ කටයුතු රනිල් වික්‍රමසිංහ ජනාධිපති තුමා එකල මුදල් වෙන් කළ බවත් එය ඉක්මනින් විවෘත කිරීමට කටයුතු කරන ලෙස ලේකම් තුමියට පැවසීය.ආදාහනාගාරයේ කටයුතුද අද වන විට අවසන් වීමට ආසන්න බැවින් ඒ පිළිබඳ සතුටු වන බවත් බිබිල නගරයේ පානීය ජල ටැංකියක් සවි කර ඇති බවත් සෑම කොට්ඨශයකම මාර්ග ප්‍රතිසංස්කරණය කර හා කාපට් අතුරා ඇති බවත් නායකඳුර ජල යෝජනා ක්‍රමය සාර්ථක කර ගැනීමට සෑම දෙනාගේම සහයෝගය ලැබුන බවත් පුවක් පැලේ ද අද වන විට විශාල වැඩ ප්‍රමාණයක් නිමා වී ඇති බවත් ශ්‍රවනාගාරයට ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබා දුන් බවත් ජංගම වෙලඳ කුටි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති බවත් එය මාර්ග අවහිර නොවන ආකාරයට ස්ථාන ගත කිරීම සුදුසු බවත් නිල නිවාස සංකීර්ණය වල් බිහි වී තිබූ බවත් අද භාගෙට එහි වැඩ කර ඇති බවත් covid 19 වසංගතය කාලයේ සභාව විසින් ජනතාවට විශාල සේවාවක් සිදුකල බවත් වීථි ලාම්පු විශාල ප්‍රමාණයක් සවි කර ඇති බවත් අපේ අවුරුදු 05 කාලය තුළදී සභාවට මුදල් උපයා ගැනීමට හැකි

වූ බවත් ඇතැම් ව්‍යාපෘති මුදල් ගැටළුව නිසා සිදු කිරීමට නොහැකි වූ බවත් තමා මේ වසර 05 කාලය පිළිබඳ සතුටු වන බවත් තම කොට්ඨාශයට වැඩක් කිරීමට හැකි වූ බවත් ඒ සම්බන්ධයෙන් සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා නිලධාරීන්ට ස්තුති වන්ත වන බවත් ප්‍රාදේශීය සභාව තුලින් මහජනතාවට උපරිම සේවාවක් කිරීමට නිලධාරී මණ්ඩලයට අවස්ථාව උදාවේවා යයි ප්‍රාර්ථනා කරන බවත් සියළු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දැක්වීම.

ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දක්වමින් මෙම මස 19 වන දින අපගේ ධූර කාලය අවසන් වන අතර මෙය අවසන් සභා වාරයද යන්නත් හිතන බවත් ලේකම්තුමිය ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ස්තූතිවන්ත වන බවත් පළමුවෙන්ම සභාවට පැමිණියේ ලොකු බලාපොරොත්තු තියාගෙන බවත් අපට ජනතාවගේ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි වූ නිසා ඒ පිළිබඳ කනගාටු වන බවත් අපේ නායකයින් අපි කියන දේවල් අහන්නේ නැති නිසා අපට මෙසේ සිදු වී ඇති බවත් ජනතාව දැඩි දුෂ්කරතාවලට මුහුණ දී ඇති බවත් ඔවුන්ට තුන් වේලම කෑමට නොහැකි තත්වයේ ඇති වී ඇති බවත් පැවසීය.අපි පත් කර ගත් ආණ්ඩුව සිද්ද කළ දේවල් මේවා වන බවත් අපේ නායකයෝ ඔවුන්ට අවශ්‍ය දේවල් කල බවත් නායකයෝ අපට කෙනෙහිලිකම් කල බවත් වසම් 40න්ම ඉතා දුෂ්කරතාවයෙන් පෙලෙන්නේ කරාඩුගල, බුළුපිටිය හා නිල්ගල වසම් වල ජනතාව බවත් කරාඩුගල මාර්ග සංවර්ධනය කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. නිවාස ගම්මානවල මුදල් තවම ලබා නොදී ඇති බව ගම්වාසීන් චෝදනා කරන බවත් මේ පිළිබඳ පරීක්ෂා කළ යුතු බවත් ඡන්දය ඉල්ලන්න ගම්වලට යා නොහැකි බවත් මිනිසුන් ඡන්දයකට අකමැති බවත් ජනතාව නැවත තමාව තෝරාගතහොත් ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට හැකි සියළුම දේවල් සිදු කරන බවත් විපක්ෂයේ සියළු මන්ත්‍රීවරුන්ට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන හා අවශ්‍ය වේලාවට වාහන ඔවුන්ට ලබා දිය යුතු බවත් නිල්ගල,බුළුපිටිය,කරාඩුගල හා ඌරාවුල ප්‍රදේශයේ ජනතාවටත් තමාට සහයෝගය දැක්වීම පිළිබඳ ආදරණීය ජනතාවට ස්තූතිවන්ත වන බවත් ගරු සභාපති තුමාටත් සුදු නිලමේ අත්තනායක මන්ත්‍රීතුමාටත් ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් මෙම සභාපතිතුමාගේ ධූර කාලයේ දී විශාල වැඩ කොටසක් බිබිල ප්‍රදේශයේ සිදු කල බවත් ඒ සඳහා සහයෝගය දැක්වූ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටම ස්තූති වන්ත වන බවත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

## ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දැක්වීම.

ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දක්වමින් අපි හරි ආඩම්බරයෙන් ඉන්නේ IMF මුදල් ලැබීම නිසා එය ලැබුනු පසු අපි ඉන්න තැනිනුත් පහලට වැටෙන බවත් විශාල ඛේදවාචකයකට ඉදිරියේදී මුහුණ දීමට සිදු වන බවත් අපට ඒ ලැබෙන්නෙත් ණය මුදලක් බවත් මෙතෙක් ලබා ගත් ණය විධිමත් ආකාරයෙන් නොයෙදීම නිසා අද මේ තත්වයට රට පත් වී ඇති බවත් ඒවා විධිමත් නොකර හුදෙක් ණය ගැනීමෙන්ම පමණක් අපට ගොඩ ඒමට නොහැකි බවත් ඒ නිසා ලැබෙන හා ලැබුනු මුදල් නිවැරදි ආකාරයට නොයෙදීම නිසා රට පහලට වැටෙන බවත් සභාව තුලදී ගත් ඇතැම් ක්‍රියාමාර්ග වලින් සතුටු විය හැකි බවත් ඇතැම් ක්‍රියාමාර්ග වලින් සතුටු විය නොහැකි බවත් ජනතාව වෙනුවෙන් සාධාරණව කටයුතු කළ බව කිව නොහැකි බවත් අනවසර ඉදිකිරීම් පිළිබඳව තීන්දු තීරණ ගත් නමුත් එය විධිමත් ආකාරයෙන් කිරීම තවමත් සිදු වී නොමැති බවත් තවමත් අනවසර ඉදිකිරීම් සිදු වන බවත් අද කතා කල සතිපොල අසල පෙට්ටි කඩය සභා තීරණයක් ගැනීමට පෙර ඉදිකර අවසන් වී ඇතිබවත් මේවාට කොහෙද නීතියක් පවතින්නේ යන්නත් පවසන ලදී.තම තමන්ගේ අභිමතය අනුව ඇතැම් තීරණ ගත් බවත් තම තමන්ගේ ආත්ම ලාභය වෙනුවෙන් කටයුතු කර ඇති බවත් මේ ප්‍රදේශයේ මිනිසුන්ගේ දේපල අත්පත් කර ගත් බවක් පේන බවත් වෙන දෙයක් නොපෙනෙන බවත් යම් අවස්ථාවල අවනීතිමත්ව අවිධිමත් ලෙස ඉදිකිරීම් කර ඇති බවත් පෙට්ටි කඩ කාරයෝ කවුද කියලා තම තමන්ගේ හෘද සාක්ෂියෙන් අහලා දැනගන්නා ලෙසත් අපි ජනතාව වෙනුවෙන්

මේවා කරා කියලා සභාව තුළ නොව ජනතාව ඉදිරියට ගොස් කිව යුතු බවත් පැවසීය.එවිට ඔවුන් විනිශ්චයක් හා තීරණයක් ලබා දෙන බවත් මේ රට නරා වලට වැටිලා තියෙන්නේ විධිමත්භාවයක් නොමැති නිසා බවත් අපි සියළුදෙනා එක්ව අලුත් රටක් ලෙස මේරට වෙනස් කරන ලෙස දෙයක් කරමු යන ආරාධනාව ඇතිව සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>මූලාසනය</u>**

ගරු මූලාසනය විසින් පිළිතුරු කථාව කරමින් මන්ත්‍රීවරුන් සියළුදෙනා හා නිලධාරීන් මණ්ඩලය විසින් ජනතාවගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කළ බවත් එලියට ගොස් අප ගත් තීන්දු තීරණ කිව යුතු බවත් ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා සාකච්ඡා කළ පරිදි බස් නැවතුම්පලේ කුණු ඉවත් කිරිම පිළිබඳ ලේකම්තුමියට මෙන්ම බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමාටත් ස්තුති වන්ත වන බවත් එසේ සියළු දෙනා එක්ව කටයුතු කලහොත් ජනතාවට කලයුතු සේවාවන් කළ හැකි බවත් අපි හිටපු කාලේ නිලධාරීන් සමඟ ගැටළු ඇති ස්ථාන වලට ගිය බවත් ඒවා විමර්ශනය කර කළ බවත් ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා දිගින් දිගටම කීවේ ඉදි කිරිම් කටයුතු ජනතාවගේ ගමනා ගමනය අවහිරයක් නොවන ආකාරයෙන් කරන ලෙසයි. සියළු දෙනා එක්ව තීන්දු තීරන ගත්තේ අපහසු තියෙන තැන් නිවැරදි කර සුදුසු ස්ථාන වල ස්ථාන ගත කළ යුතු බවයි.මේ සභා වාරයේ දී සියළුම මන්ත්‍රීවරු හොඳ දෙයට සහයෝගය ලබා දුන් බවත් හොඳ නැති දෙයට විරුද්ධව කටයුතු කළ බවත් පැවසීය. ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා ප්‍රකාශ කලා මේ කාලය තුල දී බිබිල නගරය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළ බව එහිදී මූලාසනය විසින් පැවසුවේ තමා සභාපති ධූරයෙන් ගෙදර ගියේ සභාවට සම්පත් ප්‍රමාණයක් ගෙනල්ලා දාලා බවත් සියළු වාහන තමාගේ ධූර කාලයේ දී ගත් ඒවා බවත් පැවසීය.තමන් තම ධූරයෙන් ඉවත්ව යන විට සභාව වෙනුවෙන් කළ හැකි සියළුම දේවල් සිදු කරන බවත් ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා පක්ෂය විවේචනය කරමින් ආවේගශීලීව කතා කළ බවත් එසේ කිරිමට අවශ්‍ය නොවන බවත් පක්ෂයෙන් ඉවත් වී තමා පාඩුවේ වැඩ කිරිම සුදුසු බවත් පැවසීය.අපි මේ කරන්නේ ගරු සේවයක් බවත් එදා මිනිසුන් පයින්ම මෙම සේවයට පැමිණ කටයුතු කළ බවත් මෙවර 08 දෙනෙකු ඡන්දය නොඉල්ලන බවත් මෙය සාකච්ඡා කර ගත් තීරණයක් බවත් ගරු සභාපතිතුමාට හා ගරු මන්ත්‍රී ඒ.එම්.සුදුනිලමේ මැතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් සියළු දෙනා එක්ව කටයුතු කළ යුතු බවත් මැතිවරණ නීති රීති වලට ගරු කරමින් ඉදිකිරිම් හා සංවර්ධන කටයුතු නවතා ඇති බවත් සියළු දෙනාට එක්ව ඉදිරියේ දී කටයුතු කිරිමට ශක්තිය ධෛර්ය ලැබේ වායි යන්න ප්‍රාර්ථනා කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

ජී.ජී.ආර්.සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව
බිබිල

පිටපත්
01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.